# 5 ශ්‍රේණිය සිංහල

# ගුරු අත් පොතට

# වැඩ පොත - අංක 10

**L8 S8 R8 W8**

**නිපුණතා ආවරණය - 2021**



1. සංයමයෙන් යුතු ව තම අදහස් පවසයි.
2. තම අත්දැකීම් නිරවුල් ව සහ පැහැදිලි ව පවසයි.
3. නිර්මාණ කිරීමේ දී භාෂාව උචිත පරිදි හැසිරවීමේ කුසලතාව පෙන්වයි.
4. කියවීමේ පුරුදු වර්ධනය කර ගැනීම සඳහා පුස්තකාල භාවිතයට හුරු ව ලබයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

For Online Class Details – WhatsApp 071 9020298

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_8$ $S_8$ $R_8$ $W_8$ ඉගෙනුම් පල

- ජන සංයමයෙන් යුතු ව තම අදහස් පවසයි.
- තම අත්දැකීම් නිරවුල් ව සහ පැහැදිලි ව පවසයි.
- නිර්මාණ කිරීමේ දී භාෂාව උචිත පරිදි හැසිරවීමේ කුසලතාව පෙන්වයි.
- කියවීමේ පුරුදු වර්ධනය කර ගැනීම සඳහා පුස්තකාල භාවිතයට හුරු ව ලබයි.

## චාරිකා

- පහත සඳහන් ස්ථානවලින් සුදුසු ස්ථානයක් තෝරාගෙන අධ්‍යාපන චාරිකාවක්/ක්ෂේත්‍ර චාරිකාවක් යැමට සංවිධානය කර ගන්න. එසේ නොමැති නම් වීඩියෝ පට/පින්තූර යොදා ගනිමින් චාරිකාවක අත්දැකීම් ලබා ගැනීමට කටයුතු කරන්න.

උදා : විශ්වවිද්‍යාලයක්, පුස්තකාලයක්, උද්‍යානයක්, ගොවිපලක්, කර්මාන්ත ශාලාවක්

### වාර්ෂික අධ්‍යාපන චාරිකාව

පස් වන ශ්‍රේණියේ අධ්‍යාපන චාරිකාව සඳහා ශිෂ්‍යශිෂ්‍යාවෝ එකසිය පනස් දෙනෙක් සහභාගි වූහ. හිමිදිරි උදැසනින් ගමන් ආරම්භ කළ අප පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ළඟා වන විට පෙ.ව.9.30 පමණ විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිහිටි භූමිය ඉතා අලංකාර ය. දෙපස ඇති රුස්ස ගස්වලින් පිරිසුම් මාර්ගය සෙවණ වී ඇත. මැයි, මාර, රොබරෝසියා ආදි ගස්වලින් කඩා හැලෙන කහ පැහැති මල් විටින් විට වැටෙන්නේ මල් වැස්සක් වසින්නාක් මෙනි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍යශිෂ්‍යාවන් මේ පරිසරයේ ඔබමොබ ගමන් කරනු අපට දක්නට ලැබුණි. ඔවුන් ඉතා සැහැල්ලුවෙන් හා සතුටින් කාලය ගෙවන බව අපට හැඟුණි.

විශ්වවිද්‍යාලයේ අවට සුන්දරත්වය නැරඹීමෙන් පසු අප පළමුවෙන් ම පිවිසුණේ පුස්තකාල ගොඩනැගිල්ලට ය. එහි පුස්තකාලයාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය අප ඉතා සාදරයෙන් පිළිගත්හ. සහකාර පුස්තකාලයාධිපතිතුමා අපට පුස්තකාලය පිළිබඳ ව විස්තර කර දුන්නේ ය. "මේ පුස්තකාලය ලංකාවේ තිබෙන ප්‍රධාන පුස්තකාලවලින් එකක්. එදිරිවීර සරච්චන්ද්‍ර වැනි මහ වියතුන් ශාස්ත්‍රීය කටයුතු කළේ මේ පුස්තකාලය ඇසුරු කර ගෙන යි. එවැනි වියතුන් විසින් පරිහරණය කළ තම පෞද්ගලික පොත් පවා මෙහි ඇතුළත් වෙනවා. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යශිෂ්‍යාවන් රාශියක් මෙයින් ප්‍රයෝජන ලබා ගන්නවා."

සහකාර පුස්තකාලයාධිපතිතුමාගේ කතාවට සවන් දීමෙන් අනතුරු ව අපි පුස්තකාලය නැරඹීමු. අනතුරු ව විශ්වවිද්‍යාලයේ තවත් ගොඩනැගිලි රාශියක් ද එළිමහන් රංග පීඨය ද නැරඹීමු. එක දිනකින් නැරඹීමට නොහැකි තරම් විශ්වවිද්‍යාලය ඉතා විශාල බැවින් අපි ප.ව.2.00ට පමණ විශ්වවිද්‍යාල ආපණ ශාලාවෙන් ආහාර ගෙන සවස් වන විට පාසල කරා පැමිණියෙමු.

1. චාරිකාව ගියේ කොහේට ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. සහභාගි වූයේ කවුරුන් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. චාරිකාව යැමට පාසලෙන් පිටත් වූයේ කුමන වේලාවක ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. එහි දී ශිෂ්‍යශිෂ්‍යාවන් දුටු දේ මොනවා ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. ඉදිරිපත් කළ ජන කවි වර්ගය කුමක් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6. පාසලට ආවේ කුමන වේලාවක ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## නිර්මාණ - දෙබස්

- මිතුරෙකු/ මිතුරියක සමග පහත සඳහන් දෙබස රඟ දක්වා එයට සවන් දෙන්න.



| | | |
|---|---|---|
| සමනලයා | : | මී මැසි යාළුවේ . . . මී මැසි යාළුවේ . . . |
| මීමැස්සා | : | ආ . . . කොහොම ද ඔයාට ? |
| සමනලයා | : | මම හොඳින්. බලන්නකෝ, මේ මලේ ලස්සන. |
| මීමැස්සා | : | ඒක තමයි මමත් බැලුවේ. |
| සමනලයා | : | මෙච්චර පායන කාලෙ අනිත් හැම ගහක් ම මැලවිලා. ගහක මලක් දැක්කේ කොච්චර කාලෙකින් ද ? |
| මීමැස්සා | : | ඒක තමයි යාළුවේ. මේ ගහේ විතරක් ලස්සන මලක් පිපිලා. |
| සමනලයා | : | මේ මල නිසා මුළු පළාත ම ලස්සන වෙලා. |
| මීමැස්සා | : | ඒක ඇත්ත යාළුවේ. |
| සමනලයා | : | මම නම් මේ මලෙන් පැණි බොන්නේ නෑ. |
| මීමැස්සා | : | මමත් පැණි බොන්නේ නෑ යාළුවේ. |
| සමනලයා | : | මේ මලේ ලස්සන බලන්න එන්න කියලා අපි යාළුවන්ටත් කියමු. |

- ඉහත දෙබස උදාහරණයට ගෙන දී ඇති පින්තූර අතරින් කැමති පින්තූරයක් තෝරාගෙන තෝරා ගත් පින්තූරයට අදාළ ව නිර්මාණශීලීව දෙබසක් ලියන්න. එහිදී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වෙන්න.
  - ➢ කතා කරන බසින් ලිවීම
  - ➢ ප්‍රශ්නෝත්තර ක්‍රමයට ලිවීම
  - ➢ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
  - ➢ දෙබසෙහි නිශ්චිත ආරම්භයක් සහ අවසානයක් තිබීම



රුසියානු පින්තූර කතා පොත ඇසුරෙන් අඳින ලද්දකි.



රුසියානු පින්තූර කතා පොත ඇසුරෙන් අඳින ලද්දකි.



රුසියානු පින්තූර කතා පොත ඇසුරෙන් අඳින ලද්දකි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## පුස්තකාල භාවිතය

- පොත් කියවීම සඳහා පාසල් පුස්තකාලයට යෑමට සූදානම් වන්න. (පාසල් පුස්තකාලයක් නොමැති නම් පන්ති පුස්තකාලයක් සකස් කර ගන්න.)
- පුස්තකාලයට යෑමට පෙර එහි දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව විමසන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පුස්තකාලයට ගොස් ළමා කතන්දර, කවි, ගීත, නාට්‍ය පොතක් හෝ ඓතිහාසික ස්ථාන, රජවරුන්, ස්වාභාවික ස්ථාන ආදිය පිළිබඳ තොරතුරු සඳහන් වන පොතක් හෝ තෝරා ගෙන කියවන්න. පොත කියවා අවසානයේ පහත සඳහන් පැවරුමට පිළිතුරු ලියන්න.

  - පොතේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
  - කතුවරයාගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
  - ප්‍රකාශිත වර්ෂය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
  - ප්‍රකාශන ආයතනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
  - පොත ලියා ඇත්තේ කුමක් පිළිබඳ ව ද ? . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . .

    . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

    . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

    . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

# පුනරීක්ෂණ ප්‍රශ්න - 02

**05 ශ්‍රේණිය - මව්බස**

**කාර්ය පත්‍රිකා අංක 02 - ඡේද අභ්‍යාස**

## ඡේද කියවා පිළිතුරු ලියමු.

**01. පහත සඳහන් ඡේදය කියවන්න.**

අපි රෝද පාර දිගේ වනය තුළට රිංගුවෙමු. තොරතෝංචියක් නැති ව නැඟෙන කුරුලු ගීතයෙන් නිහැඬියාව මැකී යයි. මිනිස් කටහඬක් අසන්නට නැති බැවින් කුරුලු ගීතය වුව ද සිත සලිත කරවීමේ බලයක් ලබා ඇත. ගස් දෙකක් එකට ඇතිල්ලී නැඟෙන ක්‍රී..... ක්‍රී..... නාදය ගස් අතරින් රිංගා ඈතට ම දිව යයි. අත්තෙන් අත්තට පනින රිළා වඳුරු සේනාව අප දෙස බලා සිටින්නේ අප බිය ගන්වන විලාසයකිනි. කන් බිහිරි කරවන රැහැයි නාදය වන ගැබේ පාළුවට තර්ජනයක් වුව ද සිත තුළ රජයන පාළුව බිය මුසු හැඟුම් ජනනය කරවයි.

**- වනේ ඇඳුණු පිය සටහන් -**
**පියසේන කහඳගමගේ**

- **ඡේදය ඇසුරෙන් ම පිළිතුරු ලියන්න.**

1. රෝද පාර දිගේ ගියේ කොහාට ද ? ..................................................................
2. තොරතෝංචියක් නැති ව නැඟෙන්නේ කුමක් ද? ..................................................
3. නිහැඬියාව මැකී යන්නේ කුමකින් ද? ..............................................................
4. අසන්නට නොමැති යැයි සඳහන් ව ඇත්තේ කුමන හඬ ද? .......................................
5. ඡේදයේ සඳහන් උත්තම පුරුෂ බහුවචන ක්‍රියාපදයක් සොයා ලියන්න. ..............................
6. පාපිලි තුනක් යෙදී ඇති වචනය ලියන්න. ..........................................................
7. අත්තෙන් අත්තට පනින්නේ කවු ද? ...................................................................
8. මෙහි ඇති උත්තම පුරුෂ අනුක්ත බහුවචන නාම පදය ලියන්න. ....................................
9. බහුවචන පද ලියන්න.
   - (i) ගීතය - .....................................
   - (ii) නාදය - .....................................
10. පහත සඳහන් පද වලට සමානාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.
    - (i) කැලය - .....................................
    - (ii) මාර්ගය - .....................................
    - (iii) නිශ්ශබ්දතාව - .....................................

(ලකුණු 02 x 11 = 22)

02. **පහත සඳහන් ඡේදය කියවන්න.**

නංගී වත්ත පහළ ඇවිදීමට ගිය ය. ඇය එන්නේ කරඹ , කොහුකිරිල්ල ගෙඩි කඩාගෙන ය. ඈ කරඹ ගෙඩි එකින් එක දෙන හැටි මට සිහිවෙයි. ඉදුණු ගෙඩි සියල්ල දෙන්නේ මට ය. ඒවායේ සීනි සුවඳක් මගේ නැහැයට දැනෙයි. තද කළු කරඹ ගෙඩිවල කොතරම් රසයක් තිබෙන්නට ඇද් ද?.ඈ මෙසේ මට ගෙනවුත් දුන් දේ කොපමණ ද? මගේ කටෙහි තිත්ත ගතිය තව තවත් වැඩිවෙයි. නංගී ගේ සිනහා මුහුණ මට පෙනේ. එය දැන් මලානික වන්නා සේ ය.

**(කියවීම් පොත - ඉතුරු සතේට පාඩම)**

- **ඡේදය ඇසුරෙන් ම පිළිතුරු ලියන්න.**

1. නංගී ඇවිදීමට යන්නේ කොහේ ද? ……………………………………………………………………

2. ඇය ගෙනෙන ගෙඩි වර්ග මොනවා ද? ………………………………………………………………

3. නංගී ගෙනෙන ගෙඩි වලින් දැනෙන්නේ කුමන සුවඳක් ද? ………………………………………………...

4. කරඹ ගෙඩිවල පැහැය කුමක් ද? ……………………………………………………………………….

5. පහත සඳහන් නාම පද වලට යෙදී ඇති විශේෂණ පද ලියන්න.

   (i)………………………….ගෙඩි

   (ii)………………………….මුහුණ

6. සඤ්ඤක අකුරු සහිත වචන 2 ක් ලියන්න.

   (i)………………………….

   (i)………………………….

7. දීර්ඝ ඇදය යෙදී ඇති අකුරක් ලියන්න. ……………………………………………………………………..

8. පහත පද වලට විරුද්ධාර්ථවත් පද ලියන්න.

   (i) පහළ - ……………………………………………

   (ii) ඉදුණු - ……………………………………………

9. පහත සඳහන් වැකියට විරාම ලකුණු යොදන්න.

   අයියේ සීනිබෝල ගෙනාවා ද

10. 'මතක් වෙයි' යන පදයට සමානාර්ථවත් පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ……………………………

(ලකුණු 02 x 10 = 20)

03. **පහත සඳහන් ඡේදය කියවන්න.**

අපි හතර පැයක් පමණ යාත්‍රා කොට දූපතේ දකුණු පැත්තට ළඟා වීමු. මේ වර අපි ඔරුව නැවැත්වුයේ පළමු දෙවාරයෙහිම නැවැත් වූ තැනට වඩා හොඳ තැනක ය. ගල්කුළු කිහිපයක් ඇති ඒ ගං ඉවුර මඩ වළක් නොවී ය. දිග බොරු කකුල් රාශියක් වැනි මුල්වලින් නැගී සිටි කඩොල් ගස් පෙළ දූපත වටා යෑමට තනන ලද පාලමක් වැන්න. අපි ඔරුවෙන් බැස ඔරුවේ තිබුණු සියලු දේ ගෙන ඔරුව ද ගොඩට ඇද්දෙමු. ඉවුරට මඳක් ඈතින් තිබුණු ලී කොට තුනක් පෙරළා තබා එහි ගල් දමා තළා තොටුපළක් ද සෑදුවෙමු.

**- මඩොල් දූව -**

**- මාර්ටින් වික්‍රමසිංහ -**

- **ඡේදය ඇසුරෙන් ම පිළිතුරු ලියන්න.**

1. ඔරුව ළඟා වූයේ දූපතෙහි කුමන පැත්තකට ද? ……………………………………………………….……………
2. ගං ඉවුරේ තිබුණේ මොනවා ද? ………………………………………………………………………………..
3. කඩොල් ගස් පෙළ උපමා කර ඇත්තේ කුමක් ලෙසට ද? ……………………………………………………...
4. ඔරුව ගොඩට ඇදීමට පෙර කළේ කුමක් ද? ………………………………………………………………...
5. ඡේදයේ ඇති රකාරාංශය යෙදී ඇති වචනයක් ලියන්න. ……………………………………………………..
6. ඔරු පාරු නවත්වන ස්ථානයට යෙදෙන තනි වචනය සොයා ලියන්න. ……………………………...
7. පහත සඳහන් පද වලට සමානාර්ථවත් පද ඡේදයෙන් සොයා ලියන්න.

   (i) ගොඩක් - ………………………………………………

   (ii) පාද - ………………………………………………

8. පහත සඳහන් වචන ගලපා වාක්‍ය සකස් කර ලියන්න.

   (i) වඩා / ඔරුව / හොඳ / නැවැත්වූයේ / තැනක ය

   ……………………………………………………………………………………..

   (ii) පාලමක් / කඩොල් / පෙළ / වැන්න / ගස්

   ……………………………………………………………………………………..

   (iii) තොටුපළක් / ලී කොට / ගල් / දමා / තබා / සෑදුවෙමු / අපි

   ………………………………………………………………………………………

(ලකුණු 02 x 10 = 20)

**04. පහත සඳහන් ඡේදය කියවන්න.**

විශාල සහ සමෘද්ධිමත් වනරාජධානියක් වූ ඔලොන්ගෝහි තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වූයේ කම්බු සුදු පරෙවියායි. කම්බු සහ විසිඑක් දෙනෙකුගෙන් සමන්විත ඔහුගේ ඔහුගේ පරෙවි කණ්ඩායම ලිපි, පාර්සල් , මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් ආදිය රැගෙන ඔලොන්ගෝ කැලෑවේ සිට අනිත් කැලෑවලට ගෙන ගොස් බෙදා දීමේ තැපැල් සේවාවේ නිරත වූහ. ඔවුන්ගේ කණ්ඩායම ඉතා ම කාර්යක්ෂම , ඉතා ම වේගවත් අපූරු ම කණ්ඩායමක් බවට මුළු වන රාජධානියේ ම පිළිගැනීමක් තිබිණ. ඒ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂම සහ ගුණාත්මක සේවාව වෙනුවෙන් සම්මාන රාශියක් ද පිරිනැමිණි.

- මව්බස කියවීම් පොත -

- කැලෑවේ අන්තර්ජාලය -

- **ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ලියන්න.**

1. ඔලොන්ගෝහි තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා කවු ද? ……………………………………………..
2. කම්බු සහ ඔහුගේ කණ්ඩායම අනිත් කැලෑ වලට ගෙනගොස් බෙදා දුන්නේ මොනවා ද?

   ………………………………………………………………………………………………………………

3. තැපැල් සේවාවේ නිරත පරෙවි කණ්ඩායමට සම්මාන ලැබුණේ කුමක් වෙනුවෙන් ද?

   ………………………………………………………………………………………………………………

4. ඡේදයේ ඇති ගැටය සහිත ඇලපිල්ල යෙදුණු වචනයක් සොයා ලියන්න…………………………………
5. රකාරාංශය යෙදුණු වචනය සොයා ලියන්න. ……………………………………………………………….
6. පහත සඳහන් පද වලට සමානාර්ථ පද ලියන්න.

   (i) රාශියක් - ………………………………………………..

   (ii) කැලෑවේ - ………………………………………………..

   (iii) ලිපි - ………………………………………………..

7. ඡේදයේ ඇති මහාප්‍රාණ අක්ෂරයක් සහිත වචනයක් ලියන්න. ……………………………………………
8. පහත සඳහන් පද බහුවචනයට හරවන්න.

   (i) කණ්ඩායම - ………………………………………………..

   (ii) කැලෑවේ - ………………………………………………..

(ලකුණු 02 x 11 = 22)

05. **පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.**

නව පාසල් වාරය ආරම්භ විය. එදින උදෑසන රැස්වීමේදී විදුහල්පතිතුමා සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වල සාර්ථකත්වය උදෙසා විශේෂ කතාවත් පැවැත්වීය. එහිදි විදුහල්පතිතුමා ප්‍රථමයෙන් පැවසුවේ නාම ලේඛන පරීක්ෂා කිරීමේදී සිසුන් බොහෝ දෙනෙකුගේ පැමිණීම සතුටුදායක බවත් නොපැමිණෙන සිසුන් තම පාසලට නොපැමිණීම සම්බන්ධයෙන් දෙමව්පියන්ගෙන් ලිපියක් රැගෙන ඒම අනිවාර්ය බවත් ය. සිසුන්ගේ පාසල් පොත් බෑගයෙහි එදිනෙදා කාලසටහනට අනුව අවශ්‍ය පොත්පත් පමණක් ගෙන ආ යුතු බවත් , අනවශ්‍ය දේ රැගෙන ඒමෙන් වළකින ලෙසත් පැවසී ය.

- **ඡේදය ඇසුරෙන් ම පිළිතුරු ලියන්න.**

1. විශේෂ කතාවත් පැවැත්වූයේ කවු ද ? ……………………………………………………………………………..
2. පහත සඳහන් පද වලට විරුද්ධාර්ථවත් පද ඡේදයෙන් සොයා ලියන්න.

   (i) අවශ්‍ය - ………………………………………………..

   (ii) පැමිණීම - ………………………………………………..
3. මේ කොටසේ ඇති යුගල පදයක් තෝරා ලියන්න. ……………………………………………………………..
4. ‘අලුත්’ යන වචනයට ඡේදයේ සඳහන් වචනය කුමක් ද? ……………………………………………………..
5. ‘හිමිදිරිය’ යන්නට මෙහි යෙදී ඇති පදය සොයා ලියන්න. ……………………………………………...
6. ඡේදයේ ඇති අනුක්ත පදයක් ලියන්න. …………………………………………………………………….
7. ‘<u>බෑ</u>ගයෙහි’ ඉරි ඇඳි අකුරෙන් ප්‍රකාශ වන ශබ්දය කුමක් ද? …………………………………………………

(ලකුණු 02 x 08 = 16)